# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/20 - 2011 මැයි 10 වැනි අඟහරුවාදා - 2011.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත(460 වැනි පරිච්ජේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.**

මගේ අංකය: කර /7/1/92/බී/1,

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මණ්ඩකන්ද ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ගා 3754 සහ 2010.03.31 දිනැති පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක් 0.0219 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

1. කැබලි අංක 1
ඉඩමේ නම: මණ්ඩකන්ද; විස්තරය: කුරුඳු වගාව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ටී. එච්. වික්‍රමරත්න, නො.866, මණ්ඩකන්ද, කරන්දෙනිය; ප්‍රමාණය: හෙක් 0.0219.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2011 ජූලි මස 12 වැනි දින පූ.භා 10.00 ට කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 ජූලි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එන්. එස්. ටී. කේ. ද සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කරන්දෙනිය.

2011 අප්‍රේල් මස 28 වන දින,
කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය,

05 - 611

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.